# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 64 — 1973 ජූනි 14 වැනි බ්‍රහස්පතින්ද — 1973.06.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... | 701 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 724 |


සැළකිය යුතුයි.—ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජූනි 08 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට සාප් ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවීවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$ කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනත ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවල මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලාංකිකයෙකු බව ;

(ඇ) 1973 ජූලි මස 7 වැනි දිනට වයස අවුරුදු 42 ට නොවැඩි බව (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මේ වයස් සීමාව අදල නොවේ) ;

(ඈ) ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වීම ; හෝ

(ඉ) පිරිවැය සහ කලමනාකරණය ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකුවීම හෝ (අයි.සී.එම්.ඒ.), (යු.කේ.) ;

(ඊ) වරලත් ගණකාධිකාරි ආයතනයේ සාමාජිකයෙකු වීම ( යු.කේ.).

5. පහත සඳහන් ලියවිලිවලින් කිපයක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය. (**සැලකිය යුතුයි.**—බව්තීස්ම සහතික හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලා වන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ බාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මෙයින් එකක් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂගෙන්, විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

සටහන.—(i) අයදුම්පත්වලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුයි.

(ii) ඉල්ලූ අවස්ථාවකදී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් විසින් තම තමන්ගේ අයදුම් පත්වල මුල් පිටපත ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. එහි තවත් පිටපතක් කෙළින්ම අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ, රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව, කොළඹ 7, වෙත කෙළින්ම එවිය යුතුය.

7. පත් කරනු ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු ආධුනික කාලය අවසානයේ දී පත්වීම් ස්ථිර කිරීමට පළමුව පහත සඳහන් විෂයයන් පිළිබඳ විභාගයකින් සමර්ථවීමට නියමිතය :—

(i) මුදල් රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග සහ ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහය.

8. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡෙදයෙහි සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි වෙත අවධානය යොමු කරවනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම් පත් භාර ගන්නා අවසාන දීනා සිට සති 3 ක් ඇතුළත එම අයදුම් පත ලැබුණු බව දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නොලැබුනු විට ඒ බව වහාම ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට දැන්විය යුතුයි.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම් සහ වැඩ බලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූනි මස,
කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දීය.

## (ආදර්ශ අයදුම් පත්‍රය)

### රජයේ ගණකාධිකාරි සේවයේ iv වැනි පන්තියේ ගණකාධිකාරි තනතුරු

අංකය :————
(කාර්යාලයීය . ප්‍රයෝජනය සඳහා පමණයි)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :

2. තැපැල් ලිපිනය :
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය.)

3. උපන් දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

4. ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :

| වර්ෂ | මාස | දින |
|---|---|---|
| | | |

5. ඔබ ලංකා රටවැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න.) :————.

6. උපන් ස්ථානය—(සටහන අංක (2) බලන්න) :
(අ) ඉල්ලුම්කරුගේ :..........................................
(ආ) පියාගේ :..........................................
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ : ..........................................
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ : ..........................................

7. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහක ද, අවිවාහක ද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවක ද යන බව :————.

8. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :————.
(1) සිංහල (2) දෙමළ (3) ඉංග්‍රීසි
(1) ..........................................
(2) ..........................................
(3) ..........................................

9. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල සහ වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තිය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) ...................... | .......... | .......... | (1) ...................... | .......... | .......... |
| (2) ...................... | ......... | ......... | (2) ...................... | .......... | .......... |
| (3) ...................... | .......... | .......... | (3) ...................... | .......... | .......... |
| (4) ...................... | .......... | .......... | (4) ...................... | .......... | .......... |
| (5) ...................... | .......... | .......... | (5) ...................... | .......... | .......... |

10. (ඒ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද ? ණය ගැතිව සිටින්නේ නම්, ඒ කොපමණකට ද ?

(බී) ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබූවෙක් ද ? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :

11. අධ්‍යාපන, වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් :
(ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සමර්ථ, වෘත්තිය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දිනය, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවක් :—
(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

සැලකිය යුතුයි.— ආණ්ඩුව යටතේ කළ සේවය අවයන්වීමට හේතුව මෙහි පහළ 13 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. ...................... | .......... | .......... | .......... |
| 2. ...................... | .......... | .......... | .......... |
| 3. ...................... | .......... | .......... | .......... |
| 4. ...................... | .......... | .......... | .......... |
| 5. ...................... | .......... | .......... | .......... |
| 6. ...................... | .......... | .......... | .......... |
| 7. ...................... | .......... | .......... | .......... |
| 8. ...................... | .......... | .......... | .......... |

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :

(i) ..............................................................

(ii) ..............................................................

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

සටහන්.—(1) ඔබ ලංකාවේ රට වැසියකු වී සිටින්නේ ලියාපදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

(2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඈ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව, (ආ) සහ (ඈ) සහ (ඇ) හෝ පිරවිය යුතු යි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය—

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/අමාත්‍යාංශ ප්‍රධානියාගේ අත්සන.

6-537 —73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

**පරිපාලන ඕවර්සියර් තනතුරු**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පරිපාලන ඕවර්සියර් තනතුරු සඳහා ලාංකික තරුණයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ අයදුම්පත් ලියුම් කවරයේ උඩ වම් කෙලවරේ, 'පරිපාලන ඕවර්සියර් තනතුරු සඳහා අයදුම්පත්' යන්න සඳහන් කර, 1973.06.30 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි, **ගොඩනැගිලි අධ්‍යක්ෂ, (කළමනාකාරීත්ව ශාඛාව) කොළඹ 1,** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. පුද්ගලික ලිපිනයට එවන අයදුම්පත් භාර ගනු නොලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) 1973.06.16 වැනි දිනට වයස අවුරුදු 18 කට නො අඩු හෝ 25 කට නො වැඩි විය යුතුයි. (දෙපාර්තමේන්තු සේවකයින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.) යහපත් ශරීර ශක්තියක් හා හොඳ ඇස් පෙනීමක් ද තිබිය යුතුයි.

(ආ) (i) භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහ ගණිතය ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ii) භෞතික විද්‍යාව හෝ, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහ ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් දෙකකට නොවැඩි වාර ගණනක දී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ

(iii) භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහ ගණිතය ද ඇතුළුව ඊට සම හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

**සටහන.**—ව්‍යවහාරික හෝ උසස් ගණිතයෙන් සමත් වී ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ඇත.

හෝ

(ඇ) ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වන කණිෂ්ඨ කාර්මික නිළධාරීන්ගේ පාඨමාලාව (වර්ෂ 2 යි) හෝ හාඩි කාර්මික අභ්‍යාස ආයතනයෙහි ඩිප්ලෝමා සහතිකය හෝ (සම තත්ත්වයේ සහතිකයක්), සහ

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ

(iii) ඊට උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

3. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ).

(ii) අධ්‍යාපන සහතික ;

(iii) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(iv) මෑත දී ලබාගත් චරිත සහතික දෙකක්.

4. සුදුසු අයදුම්කරුවන් නිශ්චය කරන ලද දිනක කොළඹ දී වාචික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ගමන් ගාස්තු හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

5. (i) ඉහත 2 (v) යටතේ සුදුසුකම් ලත් අය හැර තෝරාගනු ලබන අනෙකුත් අයදුම්කරුවන් 4 වෙනි පන්තියට පත් කිරීමට පෙර, දෙපාර්තමේන්තුවේ අභ්‍යාස පන්තියක 12 මසක පුහුණුවක් ලැබිය යුතුය. අභ්‍යාස පන්තියට ඇතුළත් වූ විට ඔවුන්ගේ පාඨමාලාව විශ්වාස කටයුතු අන්දමින් අනුගමනය කරන බවට සහ පුහුණුව අවසානයේ දී, දෙපාර්තමේන්තුවට (එසේ අවශ්‍ය වන්නේ නම්) පරිපාලන ඕවර්සියර්වරුන් වශයෙන් වර්ෂ 7 කට නොඅඩු කාලයක් සේවය කරන බවට ගොඩනැගිලි අධ්‍යක්ෂතැන සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුයි. මෙම සේවා කොන්දේසි නිසි ලෙස ක්‍රියාවේ යෙදවීම පිණිස පුහුණුව ලබන්නන් සහ ඔවුන්ගේ මව්පියවරුන් හෝ භාරකරුවන් දෙදෙනෙකුත් සමග ඇප ඔප්පුවකට අත්සන් තැබිය යුතුය.

(ii) පුහුණුව ලබන්නන්ට දිනකට රු. 7.50 ක දීමනාවක් (සියළු දීමනාවන් ඇතුළුව) ගෙවනු ලැබේ.

(iii) අභ්‍යාස පන්තිය අවසානයේ දී, දෙපාර්තමේන්තුවේ පත්වීමක් ලැබීම සඳහා පුහුණුව ලබන්නන්ට කිසිදු හිමිකමක් ඇති නොවන්නේ ය. එහෙත් පුහුණුව අවසානයේ දී අපේක්ෂිත ප්‍රගතිය දක්වන අයදුම්කරුවන්ට, ඇතිවන ඇබෑර්තු ගණන් අනුව, රු. 3,000 —90×11—රු. 3,990 වැටුප් පදනමක් මත IV ශ්‍රේණියේ තාවකාලික පරිපාලන ඕවර්සියර්වරුන් වශයෙන් පත්වීම් දෙනු ලැබේ.

6. දැනට රාජ්‍ය සේවයේ නියුතු, සුදුසුකම් ලබා ඇති, අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මගින් එවිය යුතුයි. එම අයදුම්පත් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තු ප්‍රධානීන් අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් මුදා හැරිය හැකි හෝ නොහැකි බව සඳහන් කළ යුතුය.

7. මෙම ගැසට් පත්‍රය I වන කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධ සහ ඊට අදාළ පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

ගොඩනැගිලි අධ්‍යක්ෂ.

71. 3. 8 වන දින.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පරිපාලන ඕවර්සියර් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ නම :————.
(සම්පූර්ණයෙන් පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. (1) උපන් දිනය සහ ස්ථානය :————.
(2) 1973. 06. 16 දිනට වයස :—
අවුරුදු :——, මාස :——, දින :————.

4. (අ) ජාතිය :————.
(ආ) ලාංකිකයෙක් ද යන බව සඳහන් කරන්න :————.
(i) උත්පත්තියෙන් ද ? :————.
(ii) ලියාපදිංචි කිරීමෙන් ද ? :————.

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ පියාගේ :————.
(ආ) අයදුම්කරුගේ පිය පස සීයාගේ :————.
(ඇ) අයදුම්කරුගේ පිය පස සීයාගේ පියාගේ :————.

6. (i) අධ්‍යාපනය ලැබූ පාසැල් :————.
(ii) සමත් වූ උසස්ම විභාග සහ දින :————.
(iii) අ. පො. ස. (සා) හෝ ජ්‍යෙ. පා. ස. විභාගයේ දී සමත් විෂයයන් (සෑම විෂයයකින්ම ලැබී ඇති ප්‍රවීනත්වය සඳහන් කරන්න) :—

| | | | |
|---|---|---|---|
| 1. | ..................... | 5. | ..................... |
| 2. | ..................... | 6. | ..................... |
| 3. | ..................... | 7. | ..................... |
| 4. | ..................... | 8. | ..................... |

7. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ දින සිට කරන ලද රැකියාවන්, ආරම්භ කළ දින සහ ස්ථාන :————.

8. කාර්මික හා වෙනත් සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි).

මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව සොයාගනු ලැබුවහොත් තේරීමට කලින් මා නුසුදුසු වීමටත්, පත්වීමෙන් පසුව එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(**සැලකිය යුතුයි.**—අයදුම්පත අයදුම්කරු විසින් ඔහුගේම අත් අකුරෙන් පිරවිය යුතුයි.)

6–570—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**කම්කරු දෙපාර්තමේන්තුව**

කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල උපදේශක තනතුරු

පහත දැක්වෙන වෘත්තීන් සම්බන්ධයෙන් උපදේශක තනතුරු සඳහා මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් අයදුම් පත් 1973 ජූලි මස 09 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිද්දෙන් කොළඹ 5, කම්කරු මහ ලේකම් කාර්යාලයේ, 8 වන මහලේ පිහිටි වෘත්තීය අභ්‍යාස අංශයේ කම්කරු කොමසාරිස් වෙත එවිය යුතුය :—

(i) වෑද්දීම.

(ii) මෝටර් කාර්මික වැඩ.

(iii) ට්‍රැක්ටර් පැදවීම් හා කාර්මික වැඩ.

2. **වේතනය.**—සියලු දීමනාවන් ඇතුළුව මසකට රු. 450 සිට රු. 500 දක්වා ගාස්තුවකි.

**සටහන.**—ගෙවන නියම ගාස්තුවේ ප්‍රමාණය, තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රවීනත්වය අනුව තීරණය කෙරේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—පත්වීම, කම්කරු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි, පළමුවෙන්ම නියමිත කාලපරිච්ඡේදයකට කොන්ත්‍රාත්තු පදනමක් මත වේ. පසුව අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමට ඉඩ ඇත. මෙම තනතුර ස්ථිර කරනු ලබන්නේ නම්, සහ තෝරාගත් අපේක්ෂකයා එම ස්ථිර තනතුරට පත් කරනු ලබන්නේ නම්, ඒ වකට ලබාගත හැකි වන පහසුකම් අනුව, ඔහු දිවයින තුළ හෝ ඉන් බැහැර පුහුණු කරවීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් සළකා බලනු ඇත.

**4. සේවා කොන්දේසි.**—(1) තෝරාගනු ලබන අයදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාද විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවට නැගීම පිණිස ද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(2) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පළමුව මුදලින් රු. 1,000ක් බැගින් ඇප තැබිය යුතුය. පසුව, එපරිදි කටයුතු කිරීමට නියම කරනු ලබන්නේ නම්, කම්කරු කොමසාරිස් විසින් ස්වාභිමතය පරිදි තීරණය කරනු ලබන ඇපයන් විශ්වාස ඇප ඔප්පුවක් යනාදිය මගින් සැපයිය යුතුය.

**5. වයස් සීමාව.**—1973. 07. 09 දිනට වයස අවුරුදු 25ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය (රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

6. අයදුම්කකරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(i) අධ්‍යාපනික—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් හයකින් වත් ලබා ගන්නා ලද අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) හෝ,

(ආ) එයට සමාන හෝ උසස් සහතිකයක් හා,

(ii) කාර්මික—

(අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ අවසාන සහතිකය, හෝ

(ආ) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය, හෝ

(ඉ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ වෘත්තීය පුහුණුගුරුවරුන් ගේ අවසාන සහතිකය, හෝ

(ඊ) ඊට සමාන හෝ උසස් සහතිකයක්,

(iii) පළපුරුද්ද—

අදාළ වෘත්තිය සම්බන්ධයෙන් පස් අවුරුදු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට සහතිකයක්,

**සටහන.**—අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ වෘත්තීය පරීක්ෂණයකින් හා ඉගැන්වීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුවය.

7. රජයේ සේවයේ දැනටමත් යෙදී සිටින අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම් පත් එවිය යුතුය. අයදුම්කරුවන් මේ තනතුරු සඳහා තෝරා ගනු ලැබුව හොත් කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය සඳහා මුදා හරින බවට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කරනු ලබන අයදුම්කරුවන් පමණක් සැළකිල්ලට භාජන වේ.

8. අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොව) යාකොට එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යයන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය හෝ බවුතිස්ම සහතිකය භාර ගනු නොලැබේ).

(ආ) (i) ලබා ඇති උසස්ම අධ්‍යාපන පිළිබඳ සහතිකය (ii) කාර්මික අධ්‍යාපන පිළිබඳ සහතික. (iii) අදාල වෘත්තීය පිළිබඳ අවුරුදු 5 ක ප්‍රයෝගික පළපුරුද්දක් ඇති බවට සහතිකයක්.

ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව පසුව දන්වනු ලැබේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 5,
1973 ජූනි මස 06 වන දින.

**ආදර්ශ අයදුම් පත්‍ර ආකෘතිය**

කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තිය අභ්‍යාස මධ්‍යස්ථානවල උපදේශක තනතුර* ට්‍රැක්ටර් පැදවීම හා කාර්මික වැඩ/වෑද්දීම්/ මෝටර් කාර්මික වැඩ

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. 1973. 07. 09 දිනට නිවැරදි වයස :—
අවුරුදු :———. මාස :———. දින :———.
උපන් දිනය :————.

4. උපන් ස්ථානය :————.
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

5. ජාතිය :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)

7. උපදෙස් දීමට හැකි ද යන වග :—
(අ) සිංහලෙන් :————.
(ආ) දෙමළෙන් :————.
(ඇ) ඉංග්‍රිසියෙන් :————.

8. කාර්මික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.)

9. වෘත්තීය පිළිබඳ ඇති පුරුද්ද විස්තර සහිතව :————.
(සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.)

10. සහතික දෙනු ලැබූ අයගේ නම් :—
(1) ————.
(2) ————

11. වෙනත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* (අයදුම්කරු එක් වෘත්තියකට වඩා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් ඒ එක් එක් වෘත්තීන් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.) (නොගැලපෙන වචන කපා හරින්න.)

6-568—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

---

**කම්කරු දෙපාර්තමේන්තුව**

**ආධුනික සැළසුම්කරු තනතුරු**

කම්කරු දෙපාර්තමේන්තුවේ ආධුනික සැළසුම්කරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙල කළ අයදුම් පත්‍ර 1973 ජූලි මස 7 දින හෝ ඊට පෙර කොළඹ 5, කම්කරු මහලේකම් කාර්යාලයේ කම්කරු කොමසාරිස් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

**2. වැටුප් ක්‍රමය.**—අවුරුද්දකට ඒකාබද්ධ වැටුප රු. 3.000—90×3—රු. 3,270 (1969. 10. 01 දිනට පෙර මෙම වැටුප් පරිමාණයට අනුරූපව පැවැති මූලික වැටුප් පරිමාණය රු. 960—72×2—රු. 1,104 වාර්ෂික).

**සංලක්ෂ්‍යය.**—4 (iii) (අ) හා 4 (iii) (ආ) ඡේදවල දක්වා ඇති සුදුසුකම් ඇති අය ඉහත දැක්වුණු වැටුප් ක්‍රමය මත පිළිවෙලින් වර්ෂයකට රු. 3,090 හා රු. 3,180 ආරම්භක වැටුප් ලැබීමට සුදුස්සෝ වෙති.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—(i) මෙම තනතුරු තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත් කරගනු ලබන අපේක්ෂකයින්, සිය පාඩම්මාලා අවංකව හා අනලස්ව හදාරා II පෙළ සැලසුම්කරුවන් වශයෙන් සුදුසුකම් ලබා ගැනීමටත්, පුහුණුව අවසන් කිරීමෙන් පසු නියම කරනු ලැබුව හොත්, පස් වර්ෂයකට නොඅඩු කාලසීමාවක් II පෙළ සැලසුම්කරුවෙකු වශයෙන් දෙපාර්තමේන්තුවට සේවය කිරීමට බැඳෙමින්, දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් පත්‍රයකට ඇතුළත් විය යුතුය. මෙම කොන්දේසි නිසියාකාරව පිළිපැදීම සඳහා පුහුණුව ලබන්නන් සහ ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් ඇපකරුවන් දෙදෙනෙකුද ඇතිව රු. 7,000 ක බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

**4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—

(i) (අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) වයස අවුරුදු 16 ට නොඅඩු අවුරුදු 22 ට නොවැඩි විය යුතුය.

(ii) (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික ගණිතය යන විෂයයන් සහිතව විෂයයන් හයකින් අ. පො. ස. (සාමාන්‍ය) පෙළ විභාගය සමත් වීම.

හෝ

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික ගණිතය යන විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වීම.

හෝ

(ඇ) ශුද්ධ ගණිතය සහ භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික ගණිතය යන විෂයයන් සමඟ ඊට උසස් විභාගයකින් සමත් වීම.

සහ

පහත දැක්වෙන සුදුසුකම්වලින් එකක් තිබිය යුතුය :—

(iii) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පූර්ණ කාල දිවා පාඨමාලාව (සැළසුම්කරු පාඨමාලාව) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම,)

හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරී පාඨමාලාව (දෑවුරුදු) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

5. **සේවා කොන්දේසි.—(අ) සාමාන්‍ය කොන්දේසි.**—මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

(ආ) **වෙනත් කොන්දේසි.**—(i) තෝරාගනු ලැබූ ඉහත 4 ඡේදයේ iii (අ) යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයින් ආධුනිකයෙකු වශයෙන් ලංකා දුම්රිය දෙපාතර්මේන්තුවේ සහ කොළඹ වරාය කොමිෂන් සභාවේ හෝ වෙනත් රජයේ ආයතනයක අවුරුදු 2 ක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතු අතර, 4 ඡේදයේ iii (ආ) යටතේ සුදුසුකම් ලබන්නන් එක් වර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුය.

(ii) එම පුහුණුවීමේ කාලය අවසානයේදී දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතුය. නියමිත පරීක්ෂණයෙන් අසමත් වීම සේවය අවසන් කිරීමට හේතුවනු ඇත. නමුත්, කම්කරු කොමසාරිස්ගේ අභිමතය පරිදි, සේවය තවත් එක් අවුරුද්දකින් දීර්ඝ කර, නැවත වරක් පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදිය හැක. දෙවැනි වරටද අසමත් වුවහොත් සේවය අවසන් කරනු ලැබේ.

(iii) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණුව පිළිබඳව සතුටුදායක ප්‍රගතියක් නොදැක්වීම හෝ යම්කිසි කරුණක් නිසා තවදුරටත් පුහුණුව ලැබීම දෙපාර්තමේන්තු අභිවෘද්ධියට හේතුනොවන්නේ නම්, කලින් දැන්වීමක් නොකර ආධුනිකයාගේ සේවය අවසන් කරනු ලැබේ.

(iv) ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් පසු සහ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වීමෙන් පසු, ආධුනිකයන් එම ශ්‍රේණියෙහි පුරප්පාඩු ඇතොත්, එක් අවුරුදු ආධුනික කාලයකට යටත්ව, II පෙළ සැළසුම්කරුවෙකු ලෙස රු. 3,432—21 × 144—රු. 6,456 යන ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය යටතේ ස්ථිර පත්වීමක් ලැබීමට සුදුසුස්සෝ වෙති.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත් සමඟ මෙහි පහත දැක්වෙන සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් දැක්වෙන සහතික.

(ඇ) මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක් (රජයේ සේවයේ නියුතු නිලධාරීන්ට මෙය අදාල නොවේ).

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම් පත් බාරගනු නොලැබේ එහෙත්, දෙපාරේමේන්තු ප්‍රධානීන්ට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් බාරගනු ලැබේ.

8. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික නමකට නොඑවිය යුතුය.

9. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙහි 6 වන ඡේදයේ සඳහන් කොන්දේසිවලට පටහැනිව එවන ලද සහතික පත්‍ර වල මුල් පිටපත් ආපසු එවනු නොලැබේ.

ජෝ. පී. ඒ. සිරිවර්ධන,
වැ. බ. කම්කරු කොමසාරිස්.

1973 ජූනි මස 06 දින,
කොළඹ 5, කම්කරු මහලේකම් කාර්යාලයේ
කම්කරු දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය—ආධුනික සැලසුම්කරු තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

(ඒ) වාසගම :————.

(බී) අනෙක් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).

(ඒ) 1973 ජූලි මස 7 දිනට වයස :—

අවුරුදු :——. මාස :——, දින :——.

4. පුරවැසි භාවය හා එය ලබාගත් අන්දම :—

(ඒ) අයදුම්කරු :————.

(බී) අයදුම්කරුගේ පියා :————.

(සී) පිය පාර්ශවයේ මුත්තා :————.

(ඩී) පිය පාර්ශ්වයේ මීමුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන්නේ නම් (ඒ) හැරුනු විට (බී) හෝ (සී) සහ (ඩී) හෝ සම්පූර්ණ කළ යුතුයි. අයදුම්කරු ලංකාවේ උපත ලැබුවේ නැතිනම් (ඒ) හැරුණු විට (බී) සහ (සී) හෝ (සී) සහ (ඩී) හෝ සම්පූර්ණ කළ යුතුයි.)

5. විවාහකද නැද්ද යන වග :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. කාර්මික සුදුසුකම් :————.

8. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියාවල් : ————.

9. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් : ————.

10. ඔබේ චරිතය සහ දක්ෂතාවය ගැන සහතික කළ හැකි දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් :————.

11. සහතික ලබාගත්තේ කාගෙන්ද :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–567—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

## මහා භාණ්ඩාගාරය

### සහකාර අධ්‍යක්ෂ තනතුරු (සංස්ථා අංශය)

මහා භාණ්ඩාගාරයේ, සංස්ථා අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මේ නිවේදනයට යා කොට ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කළ යුතු වන අයදුම් පත් 1973 ජූලි මස 5 වැනි දිනට පෙර, මුදල් අමාත්‍යාංශයේ ලේකම් (මධ්‍යම ශාඛාව), තැ. පෙ. 500, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත් බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "සහකාර අධ්‍යක්ෂ, සංස්ථා අංශය" යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

**සටහන.**—ඉල්ලුම් පත්‍රය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලීමට නොපිළිවන. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගනු ලැබිය යුතුය.

2. **වැටුප් හා දීමනා.**—ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත පදනමක් පිට, විවාහක දීමනාව ද සමග, වර්ෂයකට රුපියල් 11,040—11×—480 රු. 16,320 වැටුපක්. ද්විතීයනය කෙරෙන සංස්ථාවල නිලධාරීන් ඔවුන්ගේ සංස්ථා වැටුප් මත.

(තෝරාගනු ලැබූ අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔහු වැටුප් පරිමාණයේ පියවරක තැබිය හැකිය.)

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම—

(අ) ඔහු/ඇය විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්තව සිටින බවටද,

(ආ) 1973 ජූලි 5 වැනි දිනට වයස අවුරුදු 23 ට නො අඩු හා අවුරුදු 35 ට වැඩි නොවන බවටද, සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතු ය.

(දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපානු ඇත.)

(ඇ) **අධ්‍යාපන සුදුසුකම්.**—

(i) ලංකාවේ/එංගලන්තයේ/වේල්සයේ වරලත් ගණකාධිකාරි ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම, හෝ

(ii) එංගලන්තයේ පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වීම.

රජයේ දෙපාර්තමේන්තුවක හෝ වාණිජ්‍ය හෝ කාර්මික ආයතනයක පහත සඳහන් ක්ෂේත්‍රයන් ඇතුළත් වන විධායක ශ්‍රේණියක පළපුරුද්ද තනතුර සඳහා සුදුසු වූවායින් පසු ලබා තිබීම අතිරේක සුදුසු කමක් වනු ඇත :—

(අ) මුදල් පරිපාලනය, විමර්ශනය හා කළමනාකාරිත්වය;

(ආ) ගණන් තැබීම, පිරිවැය තැබීම හා කළමනාකාරිත්වය පිළිබඳ සවිස්තර ක්‍රම සම්පාදනය;

(ඇ) යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම හා මිල නියම කිරීම.

4. පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ සියල්ලම, ඉල්ලා සිටි විටක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (අධ්‍යාපන රෙගුලාසි සංග්‍රහයේ ප්‍රකාර උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතික භාර ගනු නො ලැබේ.);

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය;

(ඇ) වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික;

(ඈ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

**සටහන—**

(i) ඉල්ලුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

(ii) ඉල්ලා සිටි විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

5. රාජ්‍ය සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර, තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය.

6. ඉල්ලුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියකියවිල්ලක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

7. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 1 වැනි දින,
කොළඹ, ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලයේ,
මුදල් අමාත්‍යාංශයේදී ය.

### ඉල්ලුම් පත්‍ර ආකෘතිය

1. ඉල්ලුම් කරන තනතුර :————.

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය.) :————.

4. උපන් දිනය :—, වර්ෂය :————, මාසය :————. දිනය :————.

5. ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :— වර්ෂ :——, මාස :——, දින :————.

6. ඔබ ලංකා පුරවැසියෙක් ද? පාරම්පරික රටවැසියෙක් ද, එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද, යන බව සඳහන් කරන්න (සටහන අංක (1) බලන්න) :————.

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :—
   (අ) ඉල්ලුම්කරුගේ :————.
   (ආ) පියාගේ :————.
   (ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ :————.
   (ඈ) පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
   (ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවකද යන බව :————.

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.

10. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.) :————.

11. දැනට නිරත රක්ෂාව සහ ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් (රක්ෂාවලට බැඳුනු දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) :—

| පදවිය | සිට දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |

**සැලකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 13 කොටුවෙහි සඳහන් කළ යුතුය.

12. **විශේෂ සුදුසුකම්.**—(දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේ ද? එසේ ඇතොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න) :————.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6-489—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව

### ශිෂ්‍යත්ව/අධි ශිෂ්‍යත්ව ප්‍රධානය සඳහා අයදුම්පත්

(අ) උසස් පාඨමාර්ග ශිෂ්‍යත්ව (ආ) පර්යේෂණ ශිෂ්‍යත්ව (ඇ) පර්යේෂණ අධි ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—(අ) උසස් පාඨමාර්ග ශිෂ්‍යත්ව—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම ;
(ii) ශිෂ්‍යත්ව ප්‍රධානය කරනු ලබන වර්ෂයේ ජූලි මස 1 වෙනි දිනට වයස අවුරුදු 30 නොවැඩි වීම ;
(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් දරන්නෙකු වීම.

(ආ) පර්යේෂණ ශිෂ්‍යත්ව—
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම ;
(ii) ශිෂ්‍යත්ව ප්‍රධානය කරනු ලබන වර්ෂයේ ජූලි මස 1 වෙනි දිනට වයස අවුරුදු 30 නොවැඩි වීම ;
(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක 1 වෙනි හෝ 2 වෙනි පෙළ (සාමාන්‍ය හෝ විශේෂ) ගෞරව උපාධියක් දරන්නෙකු වීම ;

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින්, පර්යේෂණ පශ්චාත් උපාධියක් සඳහා ලියාපදිංචි කොට ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක (සාමාන්‍ය හෝ විශේෂ) උපාධියක් දරන්නෙකු වීම ;
(iv) යෝජිත පුහුණුවීමේ පාඨමාලාවෙන් ප්‍රයෝජනයක් ලබාගත හැකි යයි පෙනී යන, සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිර්දේශ කරනු ලබන පුද්ගලයෙක් වීම.

(ඇ) පර්යේෂණ අධි ශිෂ්‍යත්ව—
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම ;
(ii) ශිෂ්‍යත්ව ප්‍රධානය කරනු ලබන වර්ෂයේ ජූලි මස 1 වෙනි දිනට වයස අවුරුදු 45 නොවැඩි වීම ;
(iii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් 1 වෙනි පෙළ හෝ 2 වෙනි පෙළ (සාමාන්‍ය හෝ විශේෂ) ගෞරව උපාධියක් දරන්නෙකු වීම ;
(iv) සභාව සෑහීමට පත්වන පරිදි වසර 3 ක පශ්චාත් උපාධි පුහුණුවීමක් හෝ පළපුරුද්දක් ඇති ඒ පිළිබඳව ලිඛිත සාධක ඉදිරිපත් කළ හැකි පුද්ගලයෙකු වීම.

ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ සහකාර ලේකම්ගෙන් ලබා ගත හැකි විශේෂ ආකෘති පත්‍රයන්හි, පිටපත් දෙකකින් යුක්තව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර සහ ප්‍රධානය සඳහා කරනු ලබන ඉල්ලීම්—

(i) අයදුම්කරුගේ නම, ලිපිනය, අධ්‍යාපනික සුදුසුකම් සහ වෘත්තිය සුදුසුකම් දක්වමින් ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ ලේකම් ජනරාල් අමතන ලිපියකින්, සහ
(ii) ලිපිනය සහිත 9″×4″ ප්‍රමාණයේ මුද්දර සහිත ලියුම් කවරයකින් යුක්ත විය යුතුය.

අයදුම්පත් පහත අත්සන් කරන අය වෙත 1973 අගෝස්තු මස 8 වෙනි දිනට හෝ ඊට පෙර ලැබිය යුතුය.

ලේකම්—ජනරාල්.

47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 7,
1973. 06. 08.

6-566—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## අම්පාර දිස්ත්‍රික්කයේ පානමපත්තු කොට්ඨාශයේ (පොතුවිල්හි කාර්යාලය ඇති) විවාහ (උඩරට හා සාමාන්‍ය) ලේකම් ධුරය

පොතුවිල් ප්‍රදේශයේ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සෑහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ලද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායභාලය, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල ප්‍රසිද්ධ වෙළඳ පොලවල සහ සමුපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කායභාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියා, ඒවා ලියාපදිංචි කළ තැපෑලෙන් 1973 ජූලි මස 10 වෙනි දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

දිස්ත්‍රික් ලේකම් කායභාලය,
අම්පාර, 1973 මැයි මස 31 දින.

6-453—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර (දෙහිඅංග) කොට්ඨාශයේ මුස්ලිම් විවාහ ලේකම් ධුරය

ඉහත සඳහන් තනතුර සඳහා දෙහිඅංග ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ විවාහක මුස්ලිම් පුරුෂ පක්ෂයෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයදුම් කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල සමිති කාර්යාල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර කඩ සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානයන්හි ප්‍රදර්ශනය වන දැන්වීම්වල අඩංගු වේ.

3. සියළුම අයදුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1973 ජූනි මස 30 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

සී. සී. ඩී. ෆොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 මැයි 31 වෙනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කායභාලයේ දීය.

6-438—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1973 ජූලි මස 7 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මගින් අයදුම්පත් භාරගැනීම අවසන් කෙරේ.

වැඩිදුර විස්තර අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ලියා විමසන්න. කිසිම ලියවිල්ලක් පහත අත්සන් කරන අයගේ පුද්ගලික නමට එවිය යුතු නොවේ.

ජී. අමරසේන,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

සෞඛ්‍ය අමාත්‍යාංශය,
තැ. පෙ. 500, ගාලු මුවදොර,
කොළඹ, 1973 මැයි මස 31 වන දින.

6-477—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා මහ බැංකුව

### පුරප්පාඩු

මහ බැංකු සේවයේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ප්‍රථම වශයෙන් පත්වීම තාකවාලික පදනමක වනු ඇත. සුදුසුයයි පෙනී ගියහොත් පදවිලාභීන් බැංකුවේ ස්ථිර සේවයට ඇතුළත් කරගනු ඇත. අයදුම්කරුවන් පෙළපතින් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

**1. ෆෝර්මන්**

**සුදුසුකම් :**

(අ) භෞතික විද්‍යාව, උසස් ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වීම,

(ආ) අශ්ව බල 100 දක්වා වූ තනි වටයේ කේන්ද්‍රාපසාරී පොම්ප, අ. බ. 800 දක්වා වූ විදුලි බමන සහ විදුලි ඉලෙක්ට්‍රොනික් බමන හසුරුවනයන්, කිලෝවොට් 11 හේ ස්විච් යතුරු ආම්පන්න හා පරිවර්තකයන්, එල්. වී. පෝෂක පැනෙල්, තෙල් පරිපථ ඛේදක හා අඩු වෝල්ටේජ් විදුලි ක්‍රම ආදිය මෙහෙයවීම, නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම ඇතුළත් ඉංජිනේරු කටයුතු පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 7 ක පළපුරුද්ද,

(ඇ) ජලනල, මලපවාහක සහ වැසි වතුර ඉවත් කිරීමේ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික දැනුමක්,

(ඈ) විද්‍යුත්, ගොඩනැගිලි සහ ව්‍යුහ සටහන් කියවීමට හැකිකම,

(ඉ) නිතිපතා නඩත්තු වැඩසටහන් සැලසුම් කිරීමේ හැකියාව සහ එකී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහි ලා පුහුණු සහ නුපුහුණු කම්කරුවන් පරිපාලනය කිරීමේ හා ඔවුනට උපදෙස් දීමේ හැකියාව,

(ඊ) අලුත්වැඩියා කිරීම් තමන් විසින්ම කරගෙන යාම සඳහා අවශ්‍ය ශාරීරික සුදුසුකම් තිබිය යුතුය,

(උ) 1973 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 35 ට අඩු විය යුතුය,

(අශ්වබල 100 කට වැඩි ශීතකරන උපකරණ නඩත්තු කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.)

**සැ. යු.** තෝරාගත් අයදුම්කරුවන් බැංකුවේ රාජ්‍ය භාෂා අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්විය යුතු යැයි නියම කරනු ලැබේ.

**2. මිකැනික්**

**සුදුසුකම් :**

(අ) සාමාන්‍ය මිකැනික් කෙනෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය,

(ආ) කර්මාන්තශාලාවල මූලික ප්‍රායෝගික කටයුතු පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය,

(ඇ) කේන්ද්‍රාපසාරී ජල පොම්ප, වාපිරි තෙරප්පු, තෙරපු වායුවෙන් හසුරුවන උපකරණ වැඩි තෙරපු ලිහිස්සි තෙල් ඇමීමේ ක්‍රම, වේගය වැඩි කරන ගියර පෙට්ටි සහ හොරපු සුළඟින් දිය සිසිලන කුළුනුවල ප්‍රධාන පෙළේ අලුත්වැඩියාවන් සහ පූර්ණ අලුත් වැඩියා කිරීම් තනිවම කරගෙන යාමේ හැකියාවක් තිබිය යුතුය,

(ඈ) ඉංග්‍රීසි භාෂාවෙන් ඇති නිපැයුම් කරුවන්ගේ සේවා සහ අලුත්වැඩියා කිරීමේ තොරතුරු ඇතුළත් අත්පොත් කියවා තේරුම් ගැනීමට හැකි විය යුතුය,

(ඉ) යාන්ත්‍රික සටහන් කියවා තේරුම් ගැනීමේ හැකියාව,

(ඊ) 1973 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු විය යුතුය,

(අශ්වබල 100 කට වැඩි ශීතකරන උපකරණ නඩත්තු කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.)

**3. විදුලි ශිල්පී**

**සුදුසුකම් :**

(අ) යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්ද,

(ආ) විදුලි ඉංජිනේරු ආයතනයේ සහ ලංකා විදුලි බල මණ්ඩලයේ දැනට බල පැවැත්වෙන රෙගුලාසි පිළිබඳ මනා පරිචයක් තිබිය යුතුය,

(ඇ) විදුලිය හා ජවබල පරිපථ තනි කලාවේ හා කලා තුනේ බෙදුම් ක්‍රම පිළිබඳ මනා ප්‍රායෝගික අවබෝධයක් තිබිය යුතුය,

(ඈ) කිලෝ වොට් 11 ස්විච් උපකරණ ඇතුළු සියළුම වර්ගයේ විදුලි ස්විච් උපකරණ අලුත්වැඩියා කිරීමේ හා පූර්ණ අලුත් වැඩියා කිරීමේ, සහ එකී උපකරණ සේවා කිරීමේ හැකියාව තිබිය යුතුය,

(ඉ) විද්‍යුත් සටහන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් ඇති නිපැයුම් කරුවන්ගේ සේවා සහ අලුත්වැඩියා කිරීමේ තොරතුරු ඇතුළත් අත්පොත් කියවා තේරුම් ගැනීමට හැකි විය යුතුය,

(ඊ) 1973 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු විය යුතුය.

**4. කසල දවන ක්‍රියාකරවන්නා**

**සුදුසුකම් :**

(අ) විදුලියෙන් ජ්වලිත බල වායු දැවෙන කසල දවනයන් හෝ මීට සමාන අනෙකුත් වර්ගයක කසල දවනයන් හෝ ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම සම්බන්ධ නිපුනත්වයක් තිබිය යුතුය,

(ආ) තාප සහ ද්‍රව්‍යයන්ගෙන් සෑදුම් ලත් කසල දවන කුටීරයේ අලුත්වැඩියා කිරීම් ඇතුළුව කසල දවනය පිළිබඳ සියළුම කාර්මික අලුත්වැඩියා කිරීම් සිදු කිරීම සඳහා මනා දැනුමක් තිබිය යුතුය,

(ඇ) පිරිසිදු කිරීම්, අලු ඉවත් කිරීම් සහ කසල දවනයට කුණු දැමීම අඛන්ඩව කරගෙන යා හැකි පමණ හොඳ ශරීර සෞඛ්‍යයකින් සිටිය යුතුය.

(ඈ) 1973 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු විය යුතුය.

**5. ජලනල කාර්මික**

**සුදුසුකම් :**

(අ) කොළඹ මහ නගර සභාවේ ජල සම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දැනට බලපැවැත්වෙන ජලනල වැඩ පිළිබඳ බලපත්‍රයක් තිබිය යුතුය.

(ආ) ජලනල ක්‍රම සවිකිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ කටයුතු පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 7 ක පළපුරුද්ද.

(ඇ) උස් මට්ටම් සහ පහත් මට්ටම්වල සිස්ටන අලුත්වැඩියා කිරීමේ සහ සිස්ටන මූත්‍ර භාජන, මුහුණ සෝදන බේසම්, බිඩේ සහ වැසිකිළි බඳුන් සවි කිරීමේ සහ ගලවා අලුතින් සවි කිරීමේ හැකියාව.

(ඈ) අපවිත්‍ර ජලමාර්ග සහ මලාපවහන මාර්ගවල අවහිරවීම් ඇතිවී තිබෙන ස්ථාන සොයා ගැනීම සහ එම අවහිරකම් ඉවත් කිරීමේ හැකියාව.

(ඉ) 1973 ජූනි මස 30 දිනට වයස අවුරුදු 35 ට අඩු විය යුතුය.

**6. විදුලි සෝපාන ක්‍රියාකරු**

**සුදුසුකම් :**

(අ) අතින් ක්‍රියා කරවන හා දෙයාකාර සමූහ ඉගිලි ක්‍රමයෙහි විදුලි සෝපාන හා එකී විදුලි සෝපාන ක්‍රමවල සවිකොට ඇති සියළුම ආරක්ෂක විධි මෙහෙයවීම පිළිබඳ මනා පරිචයක් ලබා සිටිය යුතුය.

(ආ) යම් හදිසි අවස්ථාවකදී වහාම වරද නිවරද කිරීමේ කටයුතුවල යෙදීමේ හැකියාවක් තිබිය යුතුය.

(ඇ) 1973 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු විය යුතුය.

**වැටුප් පරිමාණයන් :**

1. ෆෝර්මන්.—රු. 345—10×4 සහ 12×6—රු. 457.
2. මිකැනික්.—රු. 295—7×13 සහ 7.50×4—රු. 416.
3. විදුලි ශිල්පී.—රු. 295—7×13 සහ 7.50×4—රු. 416.
4. කසල දවන ක්‍රියාකරවන්නා.—රු. 295—7×13 සහ 7.50×4—රු. 416.
5. ජලනල කාර්මික.—රු. 295—7×13 සහ 7.50×4—රු. 416.
6. විදුලි සෝපාන ක්‍රියාකරවන්නා.—රු. 258—4.50×10—රු. 303.

### පොදු කරුණු

(අ) රාත්‍රි සේවා විඩයන්හි වැඩ කළ යුතුයි.

(ආ) දින 7 ක සතියක් ඇතුළත දින 5½ ක කුමන හෝ කාල සීමාවක් වැඩ කිරීමට නියම කරනු ලැබේ. (විදුලි සෝපාන ක්‍රියා කරවන්නන්ට මෙය අදාළ නොවේ.)

(ඇ) වැටුපට අතිරේක වශයෙන් විවාහක දීමනාවක්ද (විවාහක නම්) ගෙවනු ලැබේ.

(ඈ) අයදුම්පත් පෝර්ම සහ වැඩිදුර විස්තර ශ්‍රී ලංකා මහා බැංකුවේ ආයතන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. (අයදුම්පත් පෝර්ම තැපැලෙන් එවිය යුතු නම් ලිපිනය ලියා මුද්දර ගැසූ කවරයක් එවිය යුතුය.)

(ඉ) අයදුම්පත්, ආයතන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව, තැ. පෙ. 590, කොළඹ 1 යන ලිපිනයට 1973 ජූනි මස 30 වැනි දින හෝ ඊට පළමු ලැබෙන සේ එවිය යුතුය.

(ඊ) අයදුම්පත් ලැබුණ බව දැනුම් දෙනු නොලැබේ. එහෙයින් අයදුම්පත් ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලෙස අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.

ආයතන අධ්‍යක්ෂ.

ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

6-571 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව

### ඇබෑර්තු

ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ වගා අංශයේ දැනට ඇබෑර්තු වී ඇති මෙහි පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ලත් ලාංකිකයන් වෙතින් අයදුම් පත් කැඳවේ.

**1. පරිපාලක තනතුරු :**

(අ) **සුදුසුකම් හා පළපුරුද්ද.**—රජයේ කෘෂිකර්ම විද්‍යාලයක (පේරාදෙණිය හෝ කුණ්ඩසාලේ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හා දුම්කොළ වගාව පිළිබඳ පළපුරුද්ද.

(ආ) **වයස් සීමාව.**—අවුරුදු 30 ටත් 45 ටත් අතර විය යුතුයි.

(ඇ) **වැටුප් පරිමාණය.**—රු. 450—550 / රු. 20×5 (සියළු දීමනා අඩංගුව) මාසිකව.

**2. ක්‍ෂෙත්‍ර නිලධාරි තනතුරු :**

(අ) **සුදුසුකම් හා පළපුරුද්ද.**—රජයේ ගොවි පාසැලේ සහතිකය හා දුම්කොළ වගාව පිළිබඳ දෑඅවුරුදු පළපුරුද්දක්.

(ආ) **වයස් සීමාව.**—අවුරුදු 25 ටත් 35 ටත් අතර විය යුතුයි.

(ඇ) **වැටුප් පරිමාණය.**—රු. 280—450 / රු. 10×8—15×6 (සියළු දීමනා අඩංගුව) මාසිකව.

**3. කොන්දෙස්තර තනතුරු :**

(අ) **සුදුසුකම් හා පළපුරුද්ද.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හා කම්කරු පාලනය ගැන අවුරුදු 2 ක පළපුරුද්ද.

(ආ) **වයස් සීමාව.**—අවුරුදු 25 ටත් 35 ටත් අතර විය යුතුයි.

(ඇ) **වැටුප් පරිමාණය.**—රු. 180—280 / රු. 10×10 (සියළු දීමනා අඩංගුව) මාසිකව.

රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි.

නම, ලිපිනය, වයස, අධ්‍යාපනික සුදුසුකම හා පළපුරුද්ද ඇතුළත් අයදුම් පත් තම තමන්ගේ සහතික පත්වල පිටපත් සමග 1973 ජූනි 22 වෙනි දින හෝ ඊට පෙර කොළඹ, තැ. පෙ. 337, ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව, සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

සභාපති,
ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව.

207/3, ධම්පාල මාවත,
කොළඹ 7.

6-572 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ II වන ශ්‍රේණියේ ආයුර්වේද කථිකාචාර්ය තනතුරු (ආයුර්වේද)

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ II වන ශ්‍රේණියේ (ආයුර්වේද) කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ.

පහත සඳහන් ආකෘති පත්‍රයට අනුව පිළියෙල කළ ඉල්ලුම් පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1973 ජූලි මස 5 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1973 ජූලි මස 12 වැනිද.

**සටහන.**—

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු— ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි.**—

(i) (අ) මෙම තනතුර තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

3. **වැටුප් හා දීමනා.**—1. තනතුර සඳහා හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය. රු. 6,720—360 × 12—11,040 කි. (ආයුර්වේද පිළිබඳ මූලික පර්යේෂණ හෝ ආයුර්වේද පිළිබඳ නොයෙකුත් නිබන්ධ පළකිරීමෙන් ලත් විශිෂ්ඨ කීර්තිය හෝ පශ්චාත් උපාධි සුදුසුකම් වලින් යුතුවූ රු. 9,600 ට පෙර කාර්යක්ෂමතා කඩ ඉමක් ඇත.)

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුනු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්ත බව ;

(බී) 1973 ජූනි මස 14 වැනි දිනට අවු. 25 ට නොඅඩු හා අවු. 40 ට නොවැඩි බව (උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන්ට බල නොපායි);

(සී) (i) පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක පළමුවෙනි පන්ති හෝ දෙවෙනි පන්තියේ ගෞරව ඩිප්ලෝමාවක් ඇති බව (1965 ට පෙර රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ උපාධිලාභියකු නම් පළමුවෙනි පන්තියේ හෝ ගෞරව පන්තියේ ඩිප්ලෝමා උපාධියක් ඇති බව) ; නැතහොත් පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයකින් පශ්චාත් උපාධියක් ලබා ඇති බව.

(ii) **සංස්කෘත හෝ හින්දි භාෂාව පිළිබඳ දැනුම අතිරේක සුදුසුකමක් වශයෙන් පිළිගනු ලැබේ.**

**5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.**—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.— අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(සී) චරිත සහතික දෙකක්— මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය **ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.**

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් **හෝ එහි පිටපතක්** හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍යසේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන් ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියකු ගේ නාමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ **ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම්** සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට **අවධානය යොමු** කරනු ලැබේ.

ඩී. ඊ. ඇස්. වීරතුංග,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

1973 මැයි මස 31 දින,
කොළඹ 1, ගාලුමුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේදී.

අංකය :————.
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

සෞඛ්‍ය අමාත්‍යාංශය

**ඉල්ලුම් පත්‍ර ෆෝර්මය**

තනතුර————

1. ඉල්ලුම්කරන තනතුර : ————.

————දෙපාර්තමේන්තුව

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.

4. උපන් දිනය :————.

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

| වර්ෂය | මාස | දින |
|---|---|---|
| | | |

6. ඔබ ලංකා රටවැසියෙක් ද? පාරම්පරික රටවැසියෙක් ද එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න) :————.

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද? අවිවාහකද? වැන්දඹුවෙක් ද, වැන්දඹුව කද යන බව :————.

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

10. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය / වෘත්තීය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| (1) | | | (1) | | |
| (2) | | | (2) | | |
| (3) | | | (3) | | |
| (4) | | | (4) | | |

11. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ටත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

12. (ඒ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද? :————.

(බී) ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

13. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සමර්ථ වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

14. දැනට නිරත රක්ෂාව හා ඊට පූර්වයෙන් කරන ලද රක්ෂාවල් : (රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) සැලකිය යුතුයි : ආණ්ඩුව යටතේ කළ සේවය අවසන්වීමට හේතුව මෙහි පහළ 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය. :—

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

15. විශේෂ සුදුසුකම් (දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න) :————.

16. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

17. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**සටහන් :**

(1) ඔබ ලංකාවේ රට වැසියකු වී සිටින්නේ ලියා පදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

(2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඈ) හෝ පිරවිය යුතුයි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවි නාමය.

දිනය :————.

6-455—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (කීට විද්‍යා අංශය) තනතුර**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (කීට විද්‍යා අංශය) තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 2, තැ. පෙ. 569, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර.—1973 ජූලි 6 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර.—1973 ජූලි 6 වැනිදා.

**සටහන් :**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) තනතුර ස්ථිරය, පත්වීම් අර්ථසාධක අරමුදල් පදනම මත වෙයි.

(ii) පත්වීම් තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවකට යටත් වෙයි.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය : වර්ෂයකට රු. 7,440—10×360 හා 11×480—16,320 (රු. 12,000 හා රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.) සිය විද්‍යාත්මක කටයුතු ක්ෂේත්‍රයේ උසස් තත්ත්වයක නියමිත පශ්චාත් උපාධියකින් හෝ ඩිප්ලෝමා විභාගයකින් සමත් නොවූවහොත්, වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 11,520 පියවරින් ඔබ්බට යාමට කිසිම නිලධාරියෙකුට හිමිකමක් නැත.

**සටහන.**—නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරණ අයදුම්කරුවකුට ඉහත වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 8,520 ක ආරම්භක වැටුපකට හිමිකම් තිබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1973 ජූලි 6 වැනි දිනට අවුරුදු 30 නොවැඩි බව (පහත (සී) (ii) යටතේ සුදුසුකම් ඇති අයවලුන්ගේ වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුයි.) (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(සී) (i) සත්ව විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක විශේෂ විද්‍යා උපාධියේ පළමුවන හෝ දෙවන පංතියේ ගෞරව උපාධියක් දරණ බව ; හෝ

(ii) කීට විද්‍යාව පිළිබඳ විශිෂ්ඨත්වය සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධියක් දරණ බව ; හෝ

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය, (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරණ ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිට පතක් නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

**කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්.**

1973 ජූනි මස 4 දින,
කොළඹ 2, තැ. පෙ. 569,
චෝක් ෂෝල් වීදියේ 315,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේදී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

පර්යේෂණ නිලධාරි (කීට විද්‍යා අංශය) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :————.
 වර්ෂය :———. මාසය :———. දිනය :———.
 (ආ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
 වර්ෂ :———. මාස :———. දින :———.

4. ඔබ ලංකා රට වැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක්ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රට වැසියෙක්ද යන බව සඳහන් කරන්න :————.
 (ලියාපදිංචි වූ රට වැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න)

5. උපන් ස්ථානය :————.
 (අ) ඉල්ලුම්කරුගේ :————.
 (ආ) පියාගේ :————.
 (ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
 (ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

6. ස්ත්‍රී පුරුෂ භාවය :————.
 (අ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවක්ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—.
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) | | | (1) | | |
| (2) | | | (2) | | |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද ? :————

10. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබාගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුන දිනය ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) :—

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |

සැළකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—

(1) ————.

(2) ————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

6-540 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ :—

**2. සම්පූර්ණ විස්තර ඇතුලත් අයදුම්පත් 1973 ජූනි මස 28 වෙනි දින හෝ ඊට පෙර, සේවක මණ්ඩල නිලධාරී (රැකියා), ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 113, ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.**

3. මෙහි දක්වා ඇති වැටුප් ක්‍රමය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

4. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ හොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965. 08. 20 වෙනි දින දරන චක්‍රලේඛයෙහි දැක්වෙන වගන්තිවලට අනුව අදාල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

**5. ඉල්ලුම් පත් ලැබුන බව නොදන්වන අතර, මෙම දැන්වීමේ සඳහන් අවශ්‍යතාවනට අනුකූලව පිළියෙල නොවුනු ඉල්ලුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.**

6. (i) **සේවා කොන්දේසි :** තෝරාගනු ලබන අපේක්ෂකයින්—

(අ) සිය ශාරීරික යෝග්‍යතාවය දැක්වීම සඳහා පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් සිය පරිවාස කාලය තුලදී ලබාගත යුතුය.

(ඇ) සිය වැටුපෙන් 6%ක් සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායක විය යුතුයි. (ඒ සඳහා සංස්ථාව විසින් 9% ක ප්‍රමාණයක් දායක වනු ඇත.)

(ඈ) සංස්ථාවේ ඕනෑම කායඛංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ යුතුව ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3 ක පරිවාස කාලය කට යටත්ව පත් කරනු ලැබේ.

**තනතුර හා වැටුප් ක්‍රමය :**

1. ඉංජිනේරු (සිවිල්) ඒ-VI ශ්‍රේණිය : රු. 350—රු. 1,350
$5 \times 40 : 6 \times 50$

**අවශ්‍ය සුදුසුකම් :**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේදී (සිවිල් ඉංජිනේරු) උපාධිය හෝ ඒ හා සමාන වෙනත් උපාධියක් ලබා තිබිය යුතුය,

(ආ) පළමුවන පංතියේ හෝ දෙවන පංතියේ සාමාර්ථයක් ලද අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

**තනතුර හා වැටුප් ක්‍රමය :**

2. වැඩනායක (ගරාජ්) බී-I ශ්‍රේණිය ; රු. 580—රු. 795
$7 \times 20 : 3 \times 25$

**අවශ්‍ය සුදුසුකම් :**

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වී සිටිය යුතුය. ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව සමත්වී ඇති අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) පිළිගත් මෝටර් ගරාජයක ආධුනිකත්වයෙහි සේවය කර තිබිය යුතු අතර, යටත් පිරිසෙයින් අවුරුදු 3ක පරිපාලන තත්ත්වයේ පළපුරුද්දක් ඇතුළුව අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) පෙට්‍රල් සහ ඩීසල් ඇන්ජින් සහිත මෝටර් රථවල සියලුම අන්දමේ අලුත්වැඩියා කිරීම් පිළිබඳව මනා පළපුරුද්දක් තිබිය යුතුය.

(ඈ) මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ විශාල වැඩපලකට ආවේනික උපකරණ හා ආයුධ පාවිච්චි කිරීම පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය.

(ඉ) හදිසි අනතුරු වලින් සිදුවන අලුත්වැඩියා කිරීමේ වැඩ ඇතුළුව අලුත්වැඩියා පිරිවැය නිවැරදිව තක්සේරු කිරීමට හැකියාවක් තිබිය යුතුය.

(ඊ) විශාල රථ සමූහයක් නඩත්තු කිරීම හා මුළුමනින් අලුත්වැඩියා කිරීම පිළිබඳ පළපුරුද්දක් ඇති අයට වැඩි සැළකිලි දක්වනු ලැබේ.

(උ) බර වාණිජ වාහන පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතු අතර, එවැනි වාහන පරීක්ෂා කිරීමේ හැකියාවක්ද තිබිය යුතුය.

3. හෙද (පිරිමි) බී-2 ශ්‍රේණිය—රු. 450—රු. 650
11 × 20

**තනතුර හා වැටුප් ක්‍රමය :**

(අ) ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති සුදුසුකම් ලත් හෙද කෙනෙකු විය යුතු අතර, යටත් පිරිසෙයින් අවු. 5ක වත් පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ආ) වයස අවුරුදු 25-45 අතර විය යුතුය.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන),
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

113, ගාලු පාර,
කොළඹ 3.

6-576 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

**සහකාර පුස්තකාලයාධිපති තනතුර—(III වැනි ශ්‍රේණිය) නිවැරදි කිරීමක්**

අංක 61 දරණ 1973.05.25 දින ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ඉහත සඳහන් තනතුර සම්බන්ධයෙන් පළවූ ඉංග්‍රීසි දැන්වීමේ 4 (ඇ) ඡේදය යටතේ ඇති සුදුසුකම් මෙසේ වැරදි සහිතව දක්වා ඇත :—

" පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව (පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම. "

සිංහල හා දෙමළ දැන්වීම් වල 4 (ඇ) ඡේදය යටතේ අවශ්‍ය සුදුසුකම් නිවැරදිව දක්වා ඇත. 4 (ඇ) ඡේදය යටතේ අවශ්‍ය සුදුසුකම් පහත දැක්වෙන අන්දමට විය යුතුය ;

" පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව (පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම. "

2. ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත බාරගන්නා අවසාන දිනය 1973.06.30 දින දක්වා දීර්ඝ කර ඇත.

ආචාර්ය පී. එච්. ඩී. එච්. ද සිල්වා,
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1973 ජූනි 05 වැනි දින,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
කොළඹ—7.

6-532 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**පනම්කාමම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

මුන්ඩිමුරිප්පු වච්චිකුලම් සහ වන්නිවිලන්කුලම් ග්‍රාමසේවක කොට්ඨාශ ඇතුළු පනම්කාමම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973. 7. 2 වැනි දින හෝ ඊට පෙර මන්නාරම දිසාපති කාර්යාලයේ දිසාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. **සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.
(ආ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.
(ඇ) යටත් පිරිසෙයින් දෙමළ හෝ ඉංග්‍රීසි 7 වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.
(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.
(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද පළාත් පාලන ආයතනවල නියෝජිතයන් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. එසේ හෙයින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ. ඉල්ලුම් පත් ලැබී තෙදිනක් ඇතුළත ඒවා ලැබුන බව දන්වනු ලැබේ.

7. මීට ප්‍රථම ගැසට් නිවේදන අනුව ඉල්ලුම් පත් ඉදිරිපත් කර ඇති අය ඔවුන්ගේ ඉල්ලුම්පත් අළුත්වැඩියා කළ යුතුයි.

එස්. කතිර්කාමනාදන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති.

1973. 05. 30 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

**ආදර්ශ අයදුම් පත**

**පනම්කාමම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචිය, ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට සම්පූර්ණ වයස :————.
   (ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක, අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳව විස්තර :————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6-436 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

**නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩපළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩපළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :—

2. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම තම—

(අ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 60 ට නොවැඩි බවටත්,

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුත් බවටත්,

(ඇ) (1) 1925 සහ 1944 කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය (ස්වභාෂා) හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය,

නැතහොත්

(2) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමර්ථ වී ඇති බවටත්, සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (එකක් පදිංචි කොටසේ ග්‍රාම සේවකගෙන් විය යුතුය).

4. රජයේ සේවකයින්, පළාත් පාලන ආයතනවල නියෝජිත යින්ගේ සහ සංස්ථා සේවකයින්ගේ ද, වයස අවුරුදු 30 ට අඩු හෝ 60 ට වැඩි හෝ අපේක්ෂකයින්ගේ අයදුම්පත් භාරගනු නොලැබේ.

5. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. එහෙත්, එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

6. අපේක්ෂකයින් උඩ පළාත ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

7. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973 ජූලි මස 20 වැනි දිනට හෝ ඊට ප්‍රථම දිසාපති, කච්චේරිය, නුවරඑළිය' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

ඇම්. සෙනෙවිරත්න බණ්ඩා,
නුවරඑළිය දිසාපති.

1973 මැයි මස 30 වැනි දින,
නුවරඑළියේ, දිසාපති කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත

**නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩ පළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර පදිංචිය හා එම ස්ථානයේ පදිංචි කාලය :————. (පදිංචි ග්‍රාම සේවක වසම ද සඳහන් කරන්න).

3. 1973 ජූලි මස 20 වැනි දිනට සම්පූර්ණ වයස :—
අවුරුදු :————, මාස :————, දින :————.

4. විවාහක ද? අවිවාහක ද? යන වග :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. රක්ෂාව :————.

7. ණය කරදර තිබේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

8. තමා සතු දේපලවල විස්තර, පිහිටීම, එකිනෙකේ වටිනාකම සහ ප්‍රමාණය :————.
(උගස් කර තිබේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කළ යුතුය.)

9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

10. මෙම තනතුර සඳහා වෙනත් හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6-487—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය**

කාර්යාල කළමණාකාර තනතුර

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ඉහත සඳහන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබා ගන්නා අයදුම් පත්‍ර මගින් අයදුම් කළ යුතුය.

**කාර්යාල කළමණාකාර :**

**වේතන පරිමාණය**—III වෙනි **ශ්‍රේණිය.**—රු. 1,200—6 × 50—රු. 1,500 සියලු දීමනා අඩංගුව මසකට.

**සුදුසුකම්.**—විධායක තනතුරක අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් තිබීම.

**හෝ**

ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව, අඩු වශයෙන් අවුරුදු 10 ක පළපුරුදුකම් තිබීම. මින් අඩු වශයෙන් අවුරුදු 5ක් විධායක තනතුරක විය යුතුය.

**පළපුරුදුකම්.**—අයදුම්කරුවන්ට පහත සඳහන් අංශ වලින් ඕනෑම දෙකක හෝ ඊට වැඩි ගණනක සෑහෙන ප්‍රමාණයක පළපුරුදුකම් තිබිය යුතුය :

**ගිණුම්**
**සේවක මණ්ඩල කළමණාකාරීත්වය**
**සාමාන්‍ය පරිපාලනය**
**ගබඩා සහ සැපයීම්**

තෝරා ගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වන වේතන පරිමාණයේ සුදුසු පියවරක තැබීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරු කන්තලේ, හිඟුරාණ හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කිරීමටද සූදානම් විය යුතුය. ඔහු විසින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් ද ලබා ගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි ප්‍රධානීන් මගින් අයදුම් පත් එවිය යුතුය.

අයදුම් පත් ලියා පදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය, තැ. පෙ. 1486; 651, ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට 1973 ජූනි මස 30 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙනසේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

615, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 5.
1973 මැයි මස 29 වෙනි දින.

6-574—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

තවද,

(ආ) පහත දැක්වෙන සුදුසුකම් අතුරෙන් එකක් හෝ ලබා සිටිය යුතුය :—

(1) ඉහත iii (අ) අනුඡේදයේ සඳහන් සුදුසුකම් ලබන විභාගයේදී අංක ගණිතය, වානිජ අංක ගණිතය හෝ ගණිතය හැර තවත් ඕනෑම විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථ ලබා සිටිය යුතුය.

හෝ

(2) ඉහත iii (අ) අනුච්ඡේදයේ නියමිත විභාගයට වඩා උසස් විභාගයකින් සමර්ථ වී සිටිය යුතුය.

(සැලකිය යුතුයි.—අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එකවර විෂයයන් 3 කින් සමත් වී සිටීම මේ සඳහා පිළිගත හැක.)

හෝ .

(3) සමුපකාර විද්‍යාලයෙන් ප්‍රදානය කරන සමුපකාර සේවකයන්ගේ සහතික පත්‍රය (එනම් සමුපකාර සේවකයන්ගේ සහතික පත්‍රය—සාමාන්‍ය පෙළ මාස 4 ක පාඨමාලාව හෝ සමුපකාර සේවකයන්ගේ සහතික පත්‍රය උසස් පෙළ මාස 9 ක පාඨමාලාව) ලබා සිටිය යුතුය.

හෝ

(4) 1973. 7. 13 දිනට අවුරුදු 5 ක ස්ථිර සේවයක් ඇති සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සුළු සේවකයෙක් හෝ අවුරුදු 5 ක ස්ථිර සේවයක් ඇති කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශකයෙකු විය යුතුය.

(iv) (අ) අපේක්ෂකයන් 1973. 7. 13 දිනට වයස අවුරුදු 19 ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි අය විය යුතුය.

(ආ) 5 (iii) වෙනි අනුඡේදයේ සඳහන් සුදුසුකම් ඇත්තාවූ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සුළු සේවකයන්ද, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශකයන්ද කෙරෙහි මේ අවශ්‍යතාවය බලපාන්නේ නැත.

**6. සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) අයදුම්පත සමග වෙනා කිසිදු ලිපි ලේඛනාදියක් නොඑවිය යුතුය. එහෙත් නියම කොට ඇති පරිදි අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය කරුණු වලින් සම්පූර්ණ නොවන කිසි අයදුම්පතක් වෙතොත් එය එහිම කුශලතා උඩම සලකා බලා ප්‍රතික්ෂේප කරන්නට ඉඩ තිබේ.

(ii) තෝරා ගන්නා ලද අපේක්ෂකයන් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතුය. එබඳු වූ අපේක්ෂකයන්ගේ ලියකියවිලි, සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ඉල්ලා සිටි විට නොපමාව ඔහු වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලි අවශ්‍යය :—

(අ) යහපත් චරිතය පිළිබඳ වගකියයුතු පුද්ගලයෙකුගෙන් ලබා ගන්නා ලද සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා රජයේ හෝ උපකෘත හෝ පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ උපකෘත පාඨශාලාවකින් ලඟදී අස්වී හෝ සිටීනම්, චරිත සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙනි. එසේ නොවන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අධිනීතිඥයෙක්, නීතිඥ කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රු. 4,800 හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකටව දන්නා, කෙළින්ම තොරතුරු ලබාගතහැකි තැනැත්තෙකු යන මොවුන් කවරෙකුගෙන් වුවද ලබාගත හැකිවේ. සහතික දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනයද එහි පැහැදිලි සේ සඳහන්ව තිබිය යුතුය.

රජයේ ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක්, හෝ (උප්පැන්නය ලියාපදිංචි නොකළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ත්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්, කිසියම් අපේක්ෂකයෙකු හට ඉදිරිපත් කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම්, එම අපේක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සලකනු ලබන්නේ සහතිකයේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දිනය.

**සංලක්ෂ්‍යය :—**

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවුරුම් සහතික හෝ බව්තීස්ම සහතික හෝ භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිත කරන එසේම ඔහු විභාගයේදී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම් යථායෝග්‍ය පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (110 වෙනි පරිච්ඡේදයේ) අංක 27 හෝ 28 දරණ නියමය අනුව ස්වකීය උප්පැන්නයෙහි දැක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ ප්‍රකාර ස්වකීය නම් වෙනස් කළ දැනට රජයේ ස්ථිර තනතුරු දරණ අපේක්ෂකයන් මේ සඳහා උප්පැන්න සහතිකයේ තමන්ගේ නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමිවූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන මුල් ලිපිය (උචිත පරිදි),

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැත්නම් ඊට අදාල වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් (උදා : පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානියාගෙන් ලබාගත් මුල් ලිපිය),

(ඉ) **ස්ථිර පදිංචිය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි.**—යම්කිසි ප්‍රදේශයක නොකඩවා පදිංචි වී සිටි බව ඔප්පු කළ යුත්තේ ඒ ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය පිළිබඳව සහතිකයක් හෝ අනික් ලිපිමය සාක්ෂියක් හෝ ඉදිරිපත් කිරීමෙනි. දිස්ත්‍රික්කයේ උපන් බව උප්පැන්න සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් තහවුරු කළ යුතුය. අනුගාමී වර්ෂ පහකට නොඅඩු කාලයක් තුළ කිසියම් දිස්ත්‍රික්කයක පිහිටි පාසල්වලදී සිය අධ්‍යාපනය ලැබූ බව ඔප්පු කළ යුත්තේ අදාල පාසැල් සහතික ඉදිරිපත් කිරීමෙනි. සිය දෙමව්පියන් මාරුවීම් සහිත සේවාවල නියුක්තව සිටින බවද ඔවුන් නිතර නිතර මාරුවීම්වලට භාජනය වූ බවද ඔප්පු කළ යුත්තේ සිය දෙමව්පියන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් ද වෙනත් ලිපිමය සාක්ෂි ඇත්නම්, ඒවාද ඉදිරිපත් කිරීමෙනි. ස්ථිර පදිංචිය වශයෙන් දක්වන දිස්ත්‍රික්කයේ පියා හෝ මව හෝ උපන් බව ඔප්පු කළ යුත්තේ අදාළ උප්පැන්න සහතික ඉදිරිපත් කිරීමෙනි. උප්පැන්න සහතික නැති අවස්ථාවලදී අනික් සතුටුදායක ලිපිමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

**7. අපේක්ෂකයන් තෝරා ගැනීමේ පිළිවෙළ.**—(i) II වෙනි ශ්‍රේණියේ සමුපකාර සමිති පරීක්ෂක ඇබෑර්තු පුරවනු ලබන්නේ ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කොට එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක සඳහා නියම කර ඇති සංඛ්‍යාවට සරිලන ලෙසය. තවද, ඒ ඇබෑර්තු පුරවනු ලබන්නේ ඒ ඒ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය ඇති ඉල්ලුම්කරුවන් අතරින් සුදුසුතම අය තෝරා ගැනීමෙනි. ස්ථිර පදිංචිය සඳහා තිබිය යුතු සුදුසුකම් ඉල්ලුම්පත්‍රය සමග ඇති උපදෙස් පත්‍රිකාවේ සඳහන් වේ.

(ii) තෝරා ගැනීමේ මිනුම්දණ්ඩ වශයෙන් සලකනු ලබන්නේ අපේක්ෂකයින් යෝග්‍යතා විභාගයේදී දක්වන ලද කුශලතාවයයි. "යෝග්‍යතා විභාගය" යන්නෙන් අදහස් කරන්නේ මෙහි 5 (iii) වෙනි අනුඡේදයේ සඳහන් විභාගයයි. සුදුසුකම් ලබා සිටින අයදුම්කරුවන් අතුරෙන් සුදුසුකම් අය තෝරා ගනු ලබන්නේ, යෝග්‍යතා විභාගයේදී ඔවුනොවුන් දක්වා ඇති කුශලතාව තක්සේරු කිරීමෙනී. මේ තක්සේරුව කරනුයේ ඔහු එම විභාගයේදී සමත් වී ඇති එක් එක් විෂයයෙන් ලබා තිබෙන සාමාර්ථයෙහි ශ්‍රේණි විශේෂය සඳහා ලකුණු දීමෙනි. පහත සඳහන් පරිදි ලකුණු දෙනු ලැබේ :—

විශිෂ්ඨ සාමාර්ථය සඳහා—ලකුණු 75 යි

සම්මාන සාමාර්ථය සඳහා—ලකුණු 50 යි

සාමාන්‍ය සාමාර්ථය සඳහා—ලකුණු 40 යි

ලකුණු දෙනු ලබන්නේ යෝග්‍යතා විභාගයේ විෂයයන් 6 කට පමණකි. යෝග්‍යතා විභාගයට වඩා උසස් විභාගවලින් ද අපේක්ෂකයා සමර්ථ වී සිටි නම් ඒ සඳහා පහත සඳහන් පදනම මත අතිරේක ලකුණු ගණනක් දෙනු ලැබේ.

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අඩුම වශයෙන් විෂයයන් 4ක් සමත් වී ඇති අපේක්ෂකයෙකුට ලකුණු 30 යි.

(සමත් වී ඇති විෂයයන් 4 ට අඩු නම් ඒ සඳහා ලකුණු දෙනු නොලැබේ.) උපාධි විභාගය සමත් වී ඇති අපේක්ෂකයෙකුට ලකුණු 70 යි.

ඉහත සඳහන් විභාගයන් දෙකම සමත් වී තිබීම සඳහා ලකුණු නොදෙනු ඇත. එයින් එක් විභාගයක් සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ.

(iii) ලකුණු දීමේ මේ ක්‍රමය අනුව වැඩිම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරෙන් එක්තරා සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත.

(iv) නායකත්වය දැරීමට ඉල්ලුම්කරුවන් තුළ ඇති සුදුසුකම් ද ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ දැනුමද පොදු ආර්ථික සහ කෘෂිකාර්මික ප්‍රශ්න පිළිබඳ දැනුමද සම්මුඛ පරීක්ෂණයේදී විමසා බලා ලකුණු දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී මේ සඳහා දෙන වැඩිම ලකුණු ගණන 75 කි.

8. **හැඳින්වීමේ පත්‍ර.**—අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේදී සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ සතුටට හේතුවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක් ;

(ආ) මෙම පරීක්ෂණයේ දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදෙස් ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්) ;

(ඇ) පරීක්ෂණ දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක හෝ පොදු සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක් ;

(ඉ) ඉල්ලුම් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසුපිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක් ;

"පසුපිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ......................................... යන අයගේ බව මම සහතික කරමි.
(අයදුම්කරුගේ සම්පූර්ණ නම)

